




# බැඳියාව පිළිබඳ ගැටුම් තේරුම් ගැනීම

## තොරතුරු පත්‍රිකාව

**ප්‍රකාශ නොකළහොත් හෝ කළමනාකරණය නොකළහොත්, බැඳියාව පිළිබඳ ගැටුම් රැකියා ස්ථානයේ දූෂණයට හා විෂමාචාරයට තුඩු දිය හැකිය.**

**රාජ්‍ය අංශයේ සේවය කරන ඕනෑම අයෙකුට, බැඳියාව පිළිබඳ ගැටුම් හඳුනා ගන්නා, ප්‍රකාශ කරන හා කළමනාකරණය කරන ආකාරය ගැන දැන ගැනීමෙන් ඒවා මගින් ඇති කරන අවදානම අවම කර ගැනීමට උපකාරී වේ.**

### බැඳියාව පිළිබඳ ගැටුම හඳුනා ගන්නේ කෙසේද

රාජ්‍ය අංශය තුළ අපට දැකගත හැකි ප්‍රධාන ගනයේ බැඳියාව පිළිබඳ ගැටුම් වර්ග තුනක් තිබේ.

පළමුවැන්න **සැබෑ** බැඳියාව පිළිබඳ ගැටුමකි. රාජ්‍ය නිලධාරියෙකුගේ රාජකාරි ඔවුන්ගේ පෞද්ගලික උවමනාවන් සමඟ ගැටෙන විට මෙය සිදු වේ.

දෙවැන්න බැඳියාව පිළිබඳ **විය හැකි** ගැටුමකි. රාජ්‍ය නිලධාරියාගේ රාජකාරි ඔවුන්ගේ පෞද්ගලික උවමනාවන් සමඟ ගැටීමේ හා ක්‍රියාවන්ට බලපෑම් ඇති කිරීමේ විභවයක් ඇති විට, මෙය සිදු වේ.

Strengthening Victoria's Integrity

තෙවැන්න **සංජානිත** බැඳියාව පිළිබඳ ගැටුමකි. පුද්ගලයෙකුගේ පෞද්ගලික උවමනාවන් රාජ්‍ය නිලධාරියෙකු ලෙස ඔවුන්ගේ රාජකාරිවලට අනිසි ලෙස බලපෑම් කළ හැකි බවට මතයක් මහජනතාව හෝ තුන්වන පාර්ශවයක් අතර ගොඩනැගුණු විට මෙය සිදු වේ.

## බැඳියාව පිළිබඳ ගැටුම කළමනාකරණය කර ගන්නේ කෙසේද

බැඳියාව පිළිබඳ ගැටුම කළමනාකරණය කිරීමේ ආරම්භක ලක්ෂ්‍යය වන්නේ රාජ්‍ය නිලධාරීන් හා කළමනාකරුවන් අතර විවෘත සන්නිවේදනය ඇතිකර ගැනීම ය. විවිධ අවස්ථාවන් හා තත්වයන් පිළිබඳව ඔබට වඩා පැහැදිලි බවක් ලබාගත හැකි තරමට, බැඳියාව පිළිබඳ ගැටුම කුමක් විය හැකිද යන්න සහ එය හැසිරවිය යුතු ආකාරය හඳුනා ගැනීමේ වඩා හොඳ සුදානමක් ඔබට ලබා දෙනු ඇත.

බැඳියාව පිළිබඳ ගැටුම් වාර්තා කිරීම සම්බන්ධයෙන් එක් එක් ආයතනයට විවිධ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇත. බැඳියාව පිළිබඳ විය හැකි ගැටුම් පිළිබඳව නිතිපතා සාකච්ඡා කිරීමට හා සමාලෝචනය කිරීමට කළමනාකරුවන්ට වගකීමක් ඇත. සංවිධානවලට බැඳියාව පිළිබඳ ගැටුම් සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්ති හා මග පෙන්වීමක් තිබීම සහ ඒවා හඳුනා ගැනීම, ප්‍රකාශ කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අපේක්ෂාවන් සැකසීම අත්‍යවශ්‍ය වේ.

රාජ්‍ය නිලධාරියෙකු ලෙස, ඔබගේ පුද්ගලික උවමනාවන් හෝ බාහිර පීඩනයට ලක් වී ඇතැයි යන හැඟීම නොසලකා ඔබ සෑම විටම මහජන යහපත උදෙසා සේවය කළ යුතුය.

## නිතර අසන ප්‍රශ්න

### ප්‍රශ්නය: බැඳියාව පිළිබඳ ගැටුමක් තිබෙන රාජ්‍ය අංශයේ නිලධාරියෙකු ඉබේම දූෂිතයෙකු ලෙස සැලකෙනවා ද?

පිළිතුර: බැඳියාව පිළිබඳ ගැටුම් සහජයෙන්ම දූෂිත නොවේ. දූෂණ පිළිබඳ අවදානම ඇති වන්නේ ඒවා නිවැරදිව හඳුනා ගැනීමට, ප්‍රකාශ කිරීමට හා කළමනාකරණය කිරීමට අප අපොහොසත් වූ විටය.

### ප්‍රශ්නය: මා කළ යුත්තේ ඒ ගැන මගේ කළමනාකරුට පැවසීම පමණක් ද?

පිළිතුර: මෙය බැඳියාව පිළිබඳ ගැටුම් කළමනාකරණය කිරීමේ පළමු විශිෂ්ට පියවර වන අතර, එය හොඳින් වාර්තාගත කරන බවට හා කළමනාකරණ සැලසුමක් සකස් කරන බවට ඔබ සහතික විය යුතුය. බැඳියාව පිළිබඳ ගැටුම හැසිරවීම හා අවදානම් අවම කිරීම කෙසේ සිදු කරන්නේ ද යන්න කළමනාකරණ සැලසුම මගින් සැකෙවින් පැහැදිලි කරනු ඇත.

### ප්‍රශ්නය: මගේ පෞද්ගලික උවමනාවන් මගේ කාර්යභාරයට අදාළද?

පිළිතුර: රාජ්‍ය නිලධාරීන්ට ඔවුන්ගේ පෞද්ගලික ජීවිතය පවත්වාගෙන යෑමේ අයිතියක් ඇත. කෙසේ වෙතත්, මහජන යහපත උදෙසා ඔවුන් තම කාර්යභාරය වගවීමකින් යුතුව හා අපක්ෂපාතී ආකාරයෙන් ඉටු කළ යුතුය.

බැඳියාව පිළිබඳ සැබෑ ගැටුමක් පවතින්නේ නම්, රාජ්‍ය නිලධාරියෙකුට තම පුද්ගලික උවමනාව හා සම්බන්ධ දැනුම හෝ පක්ෂපාතීත්වය ඔවුන්ගේ පොදු වගකීම්වලින් වෙන් කිරීම අතිශයින් දුෂ්කර ය. අවිඥානිකව, රාජ්‍ය නිලධාරියෙකුගේ ක්‍රියාවන් කෙරෙහි ඔවුන්ගේ බැඳියාව මගින් බලපෑමක් ඇති කළ හැකිය.

## ප්‍රශ්නය: බැඳියාව පිළිබඳ ගැටුමක් සැලකිල්ලට නොගෙන කාර්යය ඉටු කිරීම වඩා වැදගත් නොවේද?

පිළිතුර: කාර්යය ඉටු කිරීම යනු 'ඇති වියහැකි ඕනෑම අවදානමක් නොසලකා එය සිදු කිරීම' නොවේ. ඔබේ පළමු ප්‍රමුඛතාවය මහජන යහපත සඳහා සේවය කිරීමයි. මෙයින් අදහස් කරන්නේ බැඳියාව පිළිබඳ ගැටුම් සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතුව සිටීමයි.

## ප්‍රශ්නය: බැඳියාව පිළිබඳ ගැටුම් සියල්ලම වළක්වා ගත හැකිද?

පිළිතුර: අවාසනාවකට මෙන්, සමහර ගැටුම් වැළැක්වීමට නොහැකිය. ග්‍රාමීය හා ප්‍රාදේශීය ප්‍රදේශවල බඳවා ගැනීම් හෝ නිශ්චිත තනතුරු සඳහා සීමිත අයදුම්කරුවන්ගේ පොදු සංචිතයක් තිබීම වැනි සමහර තත්වයන් තුළ, බැඳියාවන් අතිච්ඡාදනය විය හැකිය. මේවා වාර්තාගත කිරීම හා කළමනාකරණ සැලැස්මක් ස්ථාපිත කිරීම තවමත් වැදගත් වේ.

# දූෂණය දුටු සෑම අවස්ථාවකදී ම, එය වාර්තා කිරීම ඔබේ යුතුකමකි.

**ඔබගේ සේවා ස්ථානයේ ඇති බැඳියාව පිළිබඳ ගැටුම් ප්‍රකාශයටපත් නොකිරීම හෝ නිසි ලෙස කළමනාකරණය නොකිරීම ගැන ඔබට ගැටළු තිබේ නම්, ඔබ එය වාර්තා කළ යුතුය.**

**www.ibac.vic.gov.au** හි වාර්තා කිරීම සඳහා ආරක්ෂිත මාර්ගගත පෝරමය පුරවන්න

ඔබට මාර්ගගත පෝරමයට ප්‍රවේශ වීමට අපහසු නම්, වැඩිදුර සහාය සඳහා **1300 735 135** ඔස්සේ අප අමතන්න.

Interpreter

ඔබට පරිවර්තන සහාය අවශ්‍ය නම්, **13 14 50** ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න, නැතහොත් **www.ibac.vic.gov.au/mylanguage** වෙත පිවිසෙන්න